ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

# 1984 අංක 31 දරන මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය සඳහා වූ සර්වෝදය භාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූලි මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී

1984 ජූලි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : රු. 1.20 යි

තැපැල් ගාස්තුව : ශත 60 යි

# 1984 අංක 31 දරන මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය සඳහා වූ සර්වෝදය භාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1984 ජූලි මස 25 වන දින]

එල්. ඩී.—ඕ. 19/83.

**මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය සඳහා වූ සර්වෝදය භාර අරමුදල සංස්ථාගත කිරීම සඳහා වූ පනතකි.**

**පූර්විකාව.**

අනුරාධපුර, ප්‍රසිද්ධ නොතාරිස් දිවාකර පුංචිබණ්ඩා මහදිවුල්වැව විසින් සහතික කරනු ලැබුවා වූ ද, මෙහි උපලේඛනයෙහි දක්වා ඇත්තා වූද (මෙහි මින් මතු "ඔප්පුව" යනුවෙන් සඳහන් කරනු ලබන) අංක 2217 හා 1983 මාර්තු මස හතර වන දින දරන භාර ඔප්පුව මගින්, ජාතිය කුමක් වුව ද, මිනිස් සංහතිය, සංවර්ධනය හා සාමය උදෙසා සැලකිය යුතු සේවයක් කර ඇති තැනැත්තන්, කණ්ඩායම් හෝ සංවිධාන දිරි ගැන්වීමේ කාර්යය සඳහා "මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය සඳහා වූ සර්වෝදය භාර අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන අරමුදලක් මෙතෙක් පිහිටුවනු ලැබ ඇති හෙයින් ද:

එකී භාර අරමුදලෙහි භාරකරුවන් විසින් එකී භාර අරමුදල සංස්ථාගත කිරීම සඳහා ඉල්ලීමක් කර ඇති හෙයින් හා එකී ඉල්ලීමට ඉඩදීම පොදු යහපතට හේතු වන හෙයින් ද :

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

**ලුහුඬු නාමය.**

1. මේ පනත 1984 අංක 31 දරන මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය සඳහා වූ සර්වෝදය භාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

**මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය සඳහා වූ සර්වෝදය භාර අරමුදල සංස්ථාගත කිරීම.**

2. (1) මේ පනත ආරම්භ වන දින සිට හා ඉන් පසුව, මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය සඳහා වූ සර්වෝදය භාර අරමුදල (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) "මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය සඳහා වූ සර්වෝදය භාර අරමුදල" යන නාමය හා අභිධානය යටතේ සංස්ථාවක් විය යුතු ය.

(2) (1) වන උපවගන්තියෙන් අරමුදල වෙත පවරන ලද නාමයෙන් හා මෙහි දක්වා ඇති කාර්ය සඳහා අරමුදලට අවිච්ඡින්න පැවැත්මක් තිබිය යුතු අතර, අරමුදල විසින් නඩු පැවරීම ද අරමුදලට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකිය. තවද පොදු මුද්‍රාවක් තබා ගැනීමට ද ස්වකීය අභිමතය පරිදි එය වෙනස් කිරීමට ද බලය අරමුදලට තිබිය යුතු ය.

**අරමුදලේ භාරකාර මණ්ඩලය.**

3. (1) අරමුදලෙහි පරිපාලනය, කළමනාකරණය හා පාලනය, මෙහි මින් මතු විධිවිධාන සලස්වා ඇති පරිදි සමන්විත වන භාරකාර මණ්ඩලයක් වෙත භාරවිය යුතු ය.

(2) මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන, අරමුදලෙහි භාරකාර මණ්ඩලය ජීවිත කාලය තෙක් පත් කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :—

(1) ආචාර්ය අහංගමගේ ටියුඩර් ආරියරත්න
(2) එල්ලිය වඩු කරුණානන්ද මහතා
(3) බෙරගම ආරච්චිගේ ධර්මා ගුණසිංහ මහතා
(4) සීතා වර්ජිනියා රාජසූරිය මහත්මිය

(5) විලියම් කන්දගේ මහතා
(6) මහාචාර්ය නන්දසේන රත්නපාල
(7) ආචාර්ය පැලෑනගේ අමරසිංහ
(8) සතිස් ද මැල් මහතා
(9) මල්වත්තගේ එඩ්මන්ඩ් වෝල්ටර් පීරිස් මහතා.

(3) ප්‍රාරම්භක, මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු අතර, මණ්ඩලයේ සෑම රැස්වීමක ම මූලාසනය ඔහු විසින් දරනු ලැබිය යුතු ය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, ඒ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් විසින් තමන් අතුරින් ඒ රැස්වීම සඳහා සභාපතිවරයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(4) මණ්ඩලය විසින් ස්වකීය සාමාජිකයන් අතුරින් මණ්ඩලයට ලේකම්වරයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය. රැස්වීම් පිළිබඳ දැන්වීම් යැවීම, මණ්ඩලයේ රැස්වීම්වල දී සිදුවන සියලු කටයුතු පිළිබඳව සටහන් තබාගත යුතු වාර්තා පොතක් පවත්වාගෙන යාම, මණ්ඩලය විසින් කලින් කල තමා වෙත පවරනු ලබන කර්තව්‍ය කිරීම හා කාර්ය ඉටු කිරීම ලේකම්වරයාගේ කාර්ය විය යුතු ය.

(5) යම් තැනැත්තකු —

(අ) ශ්‍රී ලංකාවෙහි හෝ වෙනත් යම් රටක හෝ බලපවත්නා යම් නීතියක් යටතේ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් හෝ තැනැත්තකු ලෙස ප්‍රකාශ කරනු ලැබ, නිදහස් කරනු නොලැබූ වස්තු භංගත්වයට පත් හෝ බුන්වත් හෝ තැනැත්තකු වේ නම්;

(ආ) චරිත දූෂණාත්මක වරදකට වරදකරු වී තිබේ නම්;

(ඇ) ශ්‍රී ලංකාවෙහි බලපවත්නා යම් නීතියක් යටතේ සිහිවිකල් හෝ මන්ද බුද්ධික තැනැත්තකු බවට තීරණය කරනු ලැබ හෝ ප්‍රකාශ කරනු ලැබ තිබේ නම්; හෝ

(ඈ) භාරකරුවකු වශයෙන් ක්‍රියා කිරීම පැහැර හරී නම් ඒ තැනැත්තා මණ්ඩලයේ සාමාජිකයකු ලෙස පත් කරනු ලැබීමට හෝ ධුරයේ කටයුතු කරගෙන යාමට හෝ සුදුස්සකු නොවිය යුතු ය.

(6) ප්‍රාරම්භක මියගිය අවස්ථාවක දී, ඔහුගේ පවුලේ ඊළඟ හෝ ළඟම ඥාතියා ඔහු වෙනුවෙන් අනුප්‍රාප්ත විය යුතු ය.

(7) ප්‍රාරම්භක හැර, මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු නොකඩවා, මාස හයක් ඉක්මවන කාලයක් සඳහා ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටින අවස්ථාවක, ඒ සාමාජිකයා ශ්‍රී ලංකාවට නැවත පැමිණෙන තෙක්, ඒ සාමාජිකයා වෙනුවෙන් වෙනත් තැනැත්තකු, ප්‍රාරම්භක විසින් ලියවිල්ලක් මගින් පත් කරනු ලැබිය හැකි ය.

(8) ප්‍රාරම්භක හැර, මණ්ඩලයේ වෙනත් යම් සාමාජිකයකු මියගිය හෝ ඉල්ලා අස් වූ අවස්ථාවක, නැතහොත්, (5) වන උපවගන්තිය ප්‍රකාර මණ්ඩලයේ සාමාජිකයකුව සිටීම අවසන් කරනු ලැබූ අවස්ථාවක, එසේ මියගිය හෝ ඉල්ලා අස් වූ හෝ සාමාජිකයකුව සිටීම අවසන් කරනු ලැබූ සාමාජිකයා වෙනුවෙන් වෙනත් තැනැත්තකු ප්‍රාරම්භක විසින් ලියවිල්ලක් මගින් පත් කරනු ලැබිය යුතු ය.

(9) මණ්ඩලයේ කටයුතු හා සම්බන්ධ සියලු කාරණාවල දී ඒකච්ඡන්දයෙන් තීරණවලට එළඹීමට මණ්ඩලයේ සාමාජිකයන් උත්සාහ දැරිය යුතු නමුත් යම් කාරණාවක් සම්බන්ධයෙන් ඔවුන් අතර යම් මත භේදයක් ඇති වුවහොත් බහුතර තීරණය අනුගම්‍ය හා බලාත්මක විය යුතු ය.

(10) මණ්ඩලය යටත් පිරිසෙයින් සෑම මාස තුනකට එක් වරක් හෝ රැස්විය යුතු අතර, එවැනි යම් රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් පස් දෙනකු විය යුතු ය.

(11) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුව නිසාම පමණක්, මණ්ඩලයේ කිසිම ක්‍රියාවක් හෝ කටයුත්තක් බලරහිත වන්නේ යයි සලකනු නොලැබිය යුතු ය.

(12) මණ්ඩලයේ සාමාජිකයන්, වේතනයක්, දීමනාවක් හෝ ප්‍රසාද මුදලක් වශයෙන් යම් පාරිශ්‍රමිකයක් ලැබීමට හිමිකම් නොලබන නමුත් ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී ඔවුන් විසින් සැබවින් ම දරනු ලබන පෞද්ගලික වියදම් ඔවුන්ට ආපසු ගෙවනු ලැබිය හැකි ය.

4. අරමුදලේ මුද්‍රාව ලේකම්වරයා භාරයෙහි විය යුතු අතර, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් ආකාරයකින් එය වෙනස් කරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ අනුමතය ඇතිව හා මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිට දී හැර, ඒ මුද්‍රාව කිසිම සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු ය. ඒ සාමාජිකයන් දෙදෙනා තමන් පැමිණ සිටි බවට සාක්ෂි වශයෙන් ඒ සාධන පත්‍රයට අත්සන් තැබිය යුතු ය. ඒ අත්සන් තැබීම, යම් තැනැත්තකු විසින් සාක්ෂිකරුවකු වශයෙන් අත්සන් තැබීමට බාහිරව විය යුතු ය. අරමුදලේ මුද්‍රාව.

5. අරමුදලේ අරමුණු පහත දැක්වෙන පරිදි විය යුතු ය :— අරමුදලේ අරමුණු.

(අ) ජාතිය කුමක් වුවද, මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය උදෙසා සේවය කර ඇති තැනැත්තන්ට, කණ්ඩායම්වලට හෝ සංවිධානවලට ත්‍යාග පිරිනැමීම ;

(ආ) ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා ඊට ආධාර කිරීම ;

(ඇ) ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමයේ කටයුතු නංවාලීම සඳහා සැලකිය යුතු සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම ; සහ

(ඈ) ඉහත දැක්වෙන අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා අවශ්‍ය හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා හෝ දේ කිරීම.

6. (1) මෙහි මින් මතු "කමිටුව" යනුවෙන් සඳහන් කරනු ලබන තැනැත්තන් පස් දෙනකුගෙන් සමන්විත තේරීම් කමිටුවක් මණ්ඩලය විසින්, එක් එක් වර්ෂයක් සඳහා පත් කරනු ලැබිය යුතු අතර, මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය උදෙසා කර ඇති සේවය හේතුකොට ගෙන ත්‍යාග පිරිනමනු ලැබීමට හිමිකම් ලබන්නේ යයි කමිටුවේ මතය වන ත්‍යාගලාභීන් නම් කිරීම සම්බන්ධයෙන් ඒ කමිටුව විසින් මණ්ඩලයට නිර්දේශ ඉදිරිපත් කරනු ලැබිය යුතු ය. තේරීම් කමිටුව.

(2) ත්‍යාග පිරිනමනු ලැබීමට යෝජනා කරනු ලබන්නේ යම් කටයුතු සම්බන්ධයෙන් ද ඒ කටයුතු, සහ —

(අ) තැනැත්තන් සම්බන්ධයෙන් වන විට, ඒ තැනැත්තෝ කවරහු ද යන වග, ඔවුන්ගේ සුදුසුකම්, තත්ත්වය හා ලිපින ; සහ

(ආ) කණ්ඩායම් හෝ සංවිධාන සම්බන්ධයෙන් වන විට, එකී කණ්ඩායම් හෝ සංවිධාන පිළිබඳ විස්තරයක් හා ඒවායේ ලිපින

පැහැදිලිව දක්වමින් එක් එක් වර්ෂයේ ජූලි මස 31 වන දිනට පෙර මණ්ඩලයේ ලේකම්වරයා වෙත ඒ නාමයෝජනා ඉදිරිපත් කළ යුතු ය.

(3) (අ) පිළිගනු ලැබිය යුතු නාමයෝජනා සහ ත්‍යාග පිරිනැමීම පිළිබඳව තීරණ ගැනීමට මණ්ඩලයට බලය තිබිය යුතු අතර, මණ්ඩලය විසින් ගනු ලබන තීරණ අවසානාත්මක විය යුතු ය. මණ්ඩලය විසින් ස්වකීය තීරණය එක් එක් වර්ෂයේ නොවැම්බර් මස පස් වන දිනට පෙර ප්‍රකාශයට පත් කරනු ලැබිය යුතු ය.

(ආ) සිරිතක් වශයෙන්, සෑම වර්ෂයක දී ම ත්‍යාග පිරිනැමීම කරනු ලැබිය යුතු ය. කෙසේ වෙතත් යම් ත්‍යාගයක් පිරිනැමීමෙන් වැළකී සිටිමට මණ්ඩලය විසින් තීරණය කළ හැකි අතර, එවැනි අවස්ථාවක, පිරිනමනු නොලැබූ එකී ත්‍යාගයේ මුදල නැවත අරමුදලේ වත්කම් බවට පත්විය යුතු ය.

ත්‍යාග පිරිනැමීම.

7. (1) සිරිතක් වශයෙන් ත්‍යාගයක්, එක් තැනැත්තකුට, කණ්ඩායමකට හෝ සංවිධානයකට පිරිනමනු ලැබිය යුතු ය. එහෙත් විශේෂ අවස්ථාවල දී, කටයුතු කිහිපයක්ම ප්‍රදානයක් ලැබීමට සුදුසුකම් ලබන්නේ යයි මණ්ඩලය සලකන්නේ නම්, ඒ එක් එක් කටයුත්ත සඳහා ඒ ත්‍යාගයේ මුදල සමාන කොටස් දෙකකට හෝ ඊට වැඩි ගණනකට බෙදනු ලැබිය හැකි ය.

(2) ත්‍යාගලාභියකු විසින් ත්‍යාගයක් ප්‍රතික්ෂේප කරනු ලබන අවස්ථාවක, එසේ ප්‍රතික්ෂේප කරනු ලබන ත්‍යාගයේ මුදල, අරමුදලේ දේපළ වශයෙන් පැවතිය යුතු ය.

(3) යම් තැනැත්තකුගේ මරණයෙන් පසු ඒ තැනැත්තාට ත්‍යාගයක් පිරිනමනු නොලැබිය යුතු ය. කෙසේ වෙතත් ත්‍යාගයක් පිරිනැමීම පිළිබඳව ප්‍රකාශයට පත් කරන ලද දිනය හා ත්‍යාග ප්‍රදානෝත්සවය සඳහා නියම කර ඇති දිනය අතරතුර ත්‍යාගලාභියකු මියගිය හොත්, ඒ ත්‍යාගයේ මුදල, ත්‍යාගලාභියාගේ උරුමක්කාරයාට හෝ උරුමක්කාරයන්ට පිරිනමනු ලැබිය යුතු ය.

(4) ත්‍යාගලාභියකු හෝ ඔහුගේ උරුමක්කාරයන් හෝ ත්‍යාගයක් භාර ගැනීමට ස්වකීය කැමැත්ත දක්වා ඇති නමුත් නොවැළැක්විය හැකි හේතු නිසා ත්‍යාගය භාර ගැනීමෙන් ඒ ත්‍යාගලාභියා හෝ ඔහුගේ උරුමක්කාරයන් වළක්වනු ලැබුවහොත්, ඒ ත්‍යාගයේ මුදල, අවුරුදු පහක කාලයක් තුළ ඔවුන් වෙනුවෙන් තබාගනු ලැබිය යුතු අතර, ඉන් ඉක්බිතිව එය අරමුදලේ වත්කම් බවට පත්විය යුතු ය.

8. (1) අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා අවශ්‍ය හෝ හිතකර හෝ ආනුෂංගික සියලු දේ අරමුදලේ නාමයෙන් කිරීමේ බලය මණ්ඩලයට තිබිය යුතු ය.

මණ්ඩලයේ බලතල හා කර්තව්‍ය.

(2) (1) වන උපවගන්තියෙන් පැවරී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, මණ්ඩලයට පහත දැක්වෙන බලතල හා කර්තව්‍ය තිබිය යුතු ය :—

(අ) මේ පනතින් පවරනු ලැබීමක් හෝ යම් මිල දී ගැනීමක්, ප්‍රදානයක්, ත්‍යාගයක්, අන්තිම කැමති පත්‍රයකින් දේපළ පැවරීමක් මගින් හෝ අන්‍යාකාරයකින් මණ්ඩලය සතු වන යම් චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගෙන, ඒ දේපළ දැරීම ;

(ආ) එවැනි යම් දේපළක් විකිණීම, උකස් කිරීම, බදුදීම, ප්‍රදානය කිරීම, සමර්පණය කිරීම, අන්තිම කැමති පත්‍රයකින් පැවරීම, පවරාදීම, හුවමාරු කිරීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ඇ) අරමුදල සතුව ඇති හෝ අරමුදල විසින් අත්කර ගන්නා ලද හෝ දරනු ලබන යම් ඉඩමක යම් ගොඩනැගිල්ලක් තැනීම ;

(ඈ) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන යම් සුරැකුම් පත්වල අරමුදලට අයත් මුදල් ආයෝජනය කිරීම ;

(ඉ) අරමුදලේ කාර්ය සඳහා, බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා වසා දැමීම සහ මණ්ඩලයේ දේපළ ඇපයක් වශයෙන් තබා හෝ එවැනි ඇපයක් නොමැතිව හෝ මුදල් ණයට ගැනීම හෝ ලබා ගැනීම ;

(ඊ) මුදල් සපයා ගැනීම සහ දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන්, මුදලින් හෝ ද්‍රව්‍යයන්ගෙන් ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග භාර ගැනීම ; සහ

(උ) අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා ආනුෂංගික හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම :

එසේ වුව ද, මණ්ඩලයේ රැස්වීමකට පැමිණ සිටින සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගේ බහුතර ඡන්දයෙන් සම්මත කර ගනු ලබන යෝජනා සම්මතයක් මගින් මණ්ඩලය විසින් තීරණය කරනු ලැබුවහොත් මිස, යම් නිශ්චල දේපළක් මිල දී ගැනීමට හෝ බද්දට ගැනීමට මණ්ඩලය විසින් භාර අරමුදලේ යම් මුදලක් ප්‍රයෝජනයට ගනු නොලැබිය යුතු ය.

9. (අ) දේශීය වශයෙන් හෝ විදේශවලින් ලබාගන්නා ලද මුදල් හෝ ලැබුණු ප්‍රදාන, ත්‍යාග හෝ පරිත්‍යාග හෝ උපලබ්ධිත හෝ එකතු කරන ලද මුදල් ;

අරමුදලට කරනු ලබන ගෙවීම්.

(ආ) ආයෝජනවලින් ලැබුණු යම් ආදායම් හෝ අරමුදලට ලැබිය යුතු වෙනත් මුදල්

අරමුදලට ගෙවනු ලැබිය යුතු ය.

අරමුදලින් කරනු ලබන ගෙවීම්.

10. (අ) ත්‍යාගලාභීන්ට ත්‍යාග ප්‍රදානය කිරීම සඳහා අවශ්‍ය මුදල් ;

(ආ) අරමුදල ක්‍රියාත්මක කිරීම, පිහිටුවීම හා පවත්වාගෙන යාම සඳහා දරන ලද වියදම් ;

(ඇ) භාරකරුවන් විසින් ස්වකීය කාර්ය ඉටු කිරීමෙහි ලා දරන ලද පෞද්ගලික වියදම් සහ නිලධරයන්ගේ, සේවකයන්ගේ හා වෙනත් සේවා නියුක්තයන්ගේ වේතන ; සහ

(ඈ) අරමුදලේ අරමුණු සාක්ෂාත් කර ගැනීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු ගෙවීම්

අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

ගිණුම් හා විගණනය.

11. (1) මණ්ඩලය විසින්, අරමුදලේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු ගනුදෙනු පිළිබඳව නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(2) මණ්ඩලය විසින් පත් කරනු ලබන සුදුසුකම් ලත් විගණකවරයකු හෝ විගණකවරයන් විසින් අරමුදලේ ගිණුම් විගණනය කරනු ලැබිය යුතු ය.

(3) ආදායම් හා වියදම් ගිණුම සහ ශේෂ පත්‍රය අත්සන් කිරීමට මණ්ඩලය විසින් යෝජනා සම්මතයක් මගින් බලය දෙනු ලැබූ මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් ඒ ගිණුම හා ශේෂ පත්‍රය අත්සන් තැබිය යුතු ය.

(4) අරමුදලේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

රීති සෑදීමට ඇති බලය.

12. (1) මණ්ඩලයේ මහා සභා රැස්වීමක දී සහ ඒ රැස්වීමට පැමිණ සිටින හා ඡන්දය දෙන සාමාජිකයන්ගෙන් තුනෙන් දෙකකට නොඅඩු සාමාජික සංඛ්‍යාවකගේ බහුතර ඡන්දයෙන්, පහත සඳහන් කාරණා සියල්ලම හෝ ඉන් යම්කිසි කාරණයක් සම්බන්ධයෙන්, අවස්ථාවෝචිත යයි මණ්ඩලය සලකන හා මේ පනතට හෝ වෙනත් ලිඛිත නීතියකට අනනුකූල නොවන, රීති මණ්ඩලය විසින් කලින් කල සාදනු ලැබිය හැකි ය :—

(අ) මණ්ඩලය විසින් කටයුතු කරගෙන යාම හා එහි කාර්ය සහ අරමුදලේ කටයුතු කිරීමෙහි ලා අනුගමනය කළ යුතු කාර්ය පටිපාටිය ;

(ආ) ත්‍යාග පිරිනැමීම හා ඒ හා සම්බන්ධ හෝ ඊට ආනුෂංගික කාරණා ;

(ඇ) අරමුදලේ සේවා නියුක්තයන් විසින් කටයුතු කරගෙන යාම සහ ඔවුන්ගේ කාර්ය හා කර්තව්‍ය ;

(ඈ) අරමුදලේ දේපළ පාලනය කිරීම හා කළමනාකරණය කිරීම සහ බැංකු ගිණුම් විවෘත කිරීම හා ඒ ගිණුම් ක්‍රියාත්මක කිරීම ·

(ඉ) අරමුදල් ලබා ගැනීම සහ ත්‍යාග, ප්‍රදාන හා පරිත්‍යාග එකතු කිරීම හා භාර ගැනීම ; සහ

(ඊ) අරමුදලේ අරමුණු හා සම්බන්ධ හෝ ඒ අරමුණුවලට ආනුෂංගික වෙනත් යම් කාරණයක්.

ඒ රීති සාදනු ලැබූ විට, එවැනිම රැස්වීමක දී සහ ඒ ආකාරයෙන් ම ඒ රීති වෙනස් කිරීම, ඒවාට යමක් එකතු කිරීම, ඒවා සංශෝධනය කිරීම හෝ පරිච්ඡින්න කිරීම කරනු ලැබිය හැකි ය.

(2) මණ්ඩලයේ සාමාජිකයන්, භාරයේ රීතිවලට යටත් විය යුතු ය.

ජනරජයේ සහ අන්‍යයන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම.

**13.** මේ පනතේ සඳහන් තැනැත්තන්ගේ හෝ ඔවුන් මගින් ඔවුන්ගෙන් හෝ ඔවුන් යටතේ හිමිකම් පාන තැනැත්තන්ගේ අයිතිවාසිකම්වලට හැර, ජනරජයේ හෝ යම් රාජ්‍ය මණ්ඩලයක හෝ සංස්ථාවක හෝ වෙනත් යම් තැනැත්තන්ගේ හෝ අයිතිවාසිකම්වලට මේ පනතේ ඇතුළත් කිසිවකින් හානියක් හෝ බලපෑමක් නොවිය යුතු ය.

ප්‍රාරම්භක.

**14.** මේ පනතෙහි "ප්‍රාරම්භක" යන්නෙන්, ඔප්පුවේ පූර්විකාවෙහි පළමුවන ඡේදයෙහි ප්‍රාරම්භක වශයෙන් සඳහන් කර ඇති තැනැත්තා අදහස් වන අතර, ඔහුගේ මරණයෙන් පසු ප්‍රාරම්භකගේ පවුලේ ඊළඟ හෝ ළඟම ඥාතියා ඉන් අදහස් වේ.

# 1984 අංක 31 දරන මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය සඳහා වූ සර්වෝදය භාර අරමුදල (සංස්ථාගත කිරීමේ) පනත

## උපලේඛනය

අංකය : 2217.

මේ භාර ඔප්පුව එක් පාර්ශ්වයකට (මෙහි මින් මතු "ප්‍රාරම්භක" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ, මොරටුවේ, රාවතාවත්ත පාරේ අංක 100 දරන ස්ථානයෙහි පදිංචි ආචාර්ය අහංගමගේ ටියුඩර් ඇරියරත්න (පද සම්බන්ධයෙන් අවශ්‍ය වූ විටක එකී යෙදුමට එකී ආචාර්ය අහංගමගේ ටියුඩර් ආරියරත්න සහ ඔහුගේ උරුමක්කාරයන්, පොල්මාකරුවන්, අද්මිනිස්ත්‍රාසිකරුවන් හා පැවරුම්ලාභීන් ද අදහස් විය යුතු අතර ඔවුන් ඒ යෙදුමට ඇතුළත් විය යුතු ය) සහ අනෙක් පාර්ශ්වයට (මෙහි මින් මතු "වත්මන් භාරකරුවන්" යනුවෙන් හඳුන්වනු ලබන හා සඳහන් කරනු ලබන) (1) කොළඹ 5, කිරුලපනේ, එඩ්මන්ටන් පාරේ අංක 5/1 දරන ස්ථානයෙහි පදිංචි මල්ලිය වඩු කරුණානාත් ද, (2) කොළඹ 10, නාලන්දා විද්‍යාලයෙහි බෙරගම ආරච්චිගේ ධර්මා ගුණසිංහ (3) මහරගම, ගොඩිගමුවේ, නිලම්මහර පාරේ අංක 31/2 දරන ස්ථානයෙහි පදිංචි සීතා වර්ජිනියා රාජපුරිය (4) මොරටුව, රාවතාවත්ත පාරේ, අංක 98 දරන ස්ථානයෙහි පදිංචි විලියම් කන්දගේ (5) මහරගම, පමුණුවේ, දේවාල පාරේ, අංක 21/2 දරන ස්ථානයෙහි පදිංචි මහාචාර්ය නන්දසේන රත්නපාල (6) නුගේගොඩ, කොහුවල, පැපිලියාන මාවතේ අංක 21/5 දරන ස්ථානයෙහි පදිංචි ආචාර්ය පැලැනගේ අමරසිංහ (7) පානදුර, වලාන, ගැලු පාරේ අංක 20 දරන ස්ථානයෙහි පදිංචි විදානෙලාගේ සතීෂ් ද මැල් සහ (8) තලවතුගොඩ, හෝකන්දර පාරේ, අංක 276 දරන ස්ථානයෙහි පදිංචි මල්වත්තගේ එඩ්මන්ඩ් වෝල්ටර් පීරිස් අතර වර්ෂ එක් දහස් නව සිය අසූ තුනක් වූ මාර්තු මස හතර වන දින වූ මෙදින අනුරාධපුරයේ දී ඇති කොට ඇතුළත් මන ලද්දේ ය.

ප්‍රාරම්භක, 1982 "අන්තර්ජාතික සංවර්ධනය සඳහා වූ බොඩුවීන් රාජ ත්‍යාගයේ" ත්‍යාගලාභී වන හෙයින් සහ දැනට ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමයේ සභාපතිවරයා වන හෙයින් ද :

තවද, ජාතිය කුමක් වුව ද, මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය උදෙසා සැලකිය යුතු සේවාවක් කර ඇති තැනැත්තන්, කණ්ඩායම් හෝ සංවිධාන දිරි ගැන්වීමට ඇති අවශ්‍යතාව තමාගේ පෞද්ගලික අවබෝධය හා අත්දැකීම් අනුව ප්‍රාරම්භක දැන සිටින හෙයින් ද :

තවද, ඉහත කී අභිප්‍රාය සාක්ෂාත් කර ගැනීම උදෙසා, "මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය සඳහා වූ සර්වෝදය භාර අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන හා හඳුන්වනු ලබන අරමුදලක් පිහිටුවීම පිණිස ඉහත කී ත්‍යාගයේ මුදල ප්‍රාරම්භක විසින් පරිත්‍යාග කොට මහජනයාගෙන් ද මුදල් ලබා ගෙන ඇති හෙයින් ද :

තවද, එකී අරමුදලින් ලැබෙන ආදායමෙන්, මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය උදෙසා සැලකිය යුතු සේවාවන් කර ඇති තැනැත්තන්ට, කණ්ඩායම්වලට හෝ සංවිධානවලට ත්‍යාග පිරිනැමීමට ප්‍රාරම්භක කැමැත්තෙන් සිටින හෙයින් ද, මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති ආකාරයට එකී උපපාදනය කළමනාකරණය කිරීම පිණිස වත්මන් භාරකරුවන් එකඟ වී ඇති හෙයින් ද ;

මේ භාර ඔප්පුවෙන් පහත දැක්වෙන පරිදි කියා සිටී :—

1. භාරය පිහිටුවනු ලබන්නේ යම් අරමුණු උදෙසා ද ඒ අරමුණු පහත දැක්වෙන පරිදි වේ :—

(අ) ජාතිය කුමක් වුවද, මිනිස් සංහතියේ, සංවර්ධනයේ හා සාමයේ ප්‍රවර්ධනය උදෙසා සේවය කර ඇති තැනැත්තන්ට, කණ්ඩායම් වලට හෝ සංවිධානවලට ත්‍යාග පිරි නැමීම ;

(ආ) ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන සංගමයේ අරමුණු සාක්ෂාත් කර ගැනීමෙහි ලා ඊට ආධාර කිරීම ;

(ඇ) සර්වෝදය කටයුතු නංවාලීම සඳහා සැලකිය යුතු සේවයක් කර ඇති තැනැත්තන්ට ත්‍යාග පිරිනැමීම; සහ

(ඈ) ඉහත දැක්වෙන අරමුණු සාක්ෂාත් කර ගැනීමේදී ලා අවශ්‍ය හෝ හිතකර වෙනත් සියලු ක්‍රියා හා දේ කිරීම.

2. මෙහි මින් මතු දක්වා ඇති බලතල ඇතිව හා ඒ බලතලවලට හා විධිවිධාන වලට යටත්ව, භාරකරුවන් විසින් විශ්වසනීය භාරයට ගෙන දැරීම පිණිස ද, පරිහරණය කරනු ලැබීම පිණිස ද මේ ඔප්පුවේ දිනයෙහි බල පවත්නා විනිමය අනුප්‍රමාණය අනුව රුපියල් දොළොස් ලක්ෂ හැට දහස් අටසිය අසූ දෙකකට (රු. 12,60,882) සමාන වන්නා වූ ඇමරිකානු ඩොලර් හැට දහස් හතලිස් දෙකකින් (60,042) සමන්විත අරමුදල ප්‍රාරම්භක විසින් භාරකරුවන් වෙත මෙයින් භාර දෙනු ලැබේ.

3. මේ භාරය ක්‍රියාත්මක කළ යුතු ආකාරය හා අන්දම ද මෙහි දක්වා ඇති ත්‍යාග කිසිවක් පිරිනැමීම හෝ ප්‍රදානය කිරීම පිළිබඳව ද නිගම කරමින් භාරකරුවන් විසින් රීති සාදනු ලැබිය යුතු ය.

4. භාරකරුවන් විසින්, ස්වකීය අභිමතය පරිදි සුදුසු යයි කල්පනා කරන සුරැකුම්පත්වල සහ සුදුසු යයි ඔවුන් කල්පනා කරන ඉඩම් අත්කර ගැනීම හා දැරීම සඳහා භාර අරමුදල ආයෝජනය කරනු ලැබිය හැකි ය.

5. භාරකරුවන් විසින්, භාර අරමුදලේ ආදායමෙන් මේ උපපාදනය වඩාත් වාසි සැලසෙන අන්දමින් කළමනාකරණය කළ යුතු ය.

6. මේ භාරය පවත්වා ගෙන යාමේ කාර්ය සඳහා භාර දේපළ ඇපයක් ලෙස තබා මුදල් ණයට ගැනීමට භාරකරුවන්ට බලය තිබිය යුතු ය.

7. භාරකරුවන්, ඔවුන් ජීවත්ව සිටින තාක් කල් ධුර දැරිය යුතු ය.

8. ප්‍රාරම්භක ද, ඔහු ජීවත්ව සිටින තාක් කල් මේ භාරය යටතේ භාරකරුවකු විය යුතු අතර, ඔහු මියගිය විට, ඔහුගේ ඊළඟ හෝ ළඟම ඥාතියා ඔහු වෙනුවට ආදේශ කරනු ලැබිය යුතු ය.

9. යම් භාරකරුවකු මියගියහොත් හෝ ඉල්ලා අස් වුවහොත් හෝ බංකොලොත් භාවයට පත් වුවහොත් හෝ චරිත දූෂණාත්මක වරදකට අධිකරණයක් මගින් වරදකරු කරනු ලැබුවහොත් හෝ වස්තු භංගත්වයට නැතහොත් ස්ථිර අශක්‍යතාවකට පත් වුවහොත්, ප්‍රාරම්භක විසින්, ඔහු ජීවත්ව සිටින තාක් කල් නැතහොත් ඔහු මිය ගොස් ඇති විටක, ඔහුගේ ඊළඟ හෝ ළඟම ඥාතියා විසින්, ලියවිල්ලක් මගින් පත් කරනු ලබන යම් තැනැත්තකු ඉහත කී තැනැත්තකු වෙනුවට ආදේශ කරනු ලැබිය යුතු ය:

එසේ වුවද, යම් භාරකරුවකු මාස හයක් වූ අඛණ්ඩ කාලයක් ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටියහොත්, ඒ භාරකරු නැවත ශ්‍රී ලංකාවට පැමිණෙන තෙක් ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම පිණිස, ප්‍රාරම්භක විසින්, ඔහු ජීවත්ව සිටින තාක් කල් නැතහොත් ඔහු මියගොස් ඇති විටක, ඔහුගේ ඊළඟ හෝ ළඟම ඥාතියා විසින්, සුදුසු තැනැත්තකු ලියවිල්ලක් මගින් පත් කරනු ලැබිය හැකි ය.

10. භාර දේපළ කළමනාකරණය කිරීම හා පාලනය කිරීම භාරකරුවන් සතු විය යුතු ය.

11. භාරයේ කටයුතු සම්බන්ධයෙන් භාරකරුවන් අතර මතභේදයක් පවතින අවස්ථාවක, භාරය සම්බන්ධයෙන් භාරකරුවන් වැඩි දෙනාගේ තීරණය අනුගම්‍ය සහ බලසහිත විය යුතු අතර, ඒ තීරණය ක්‍රියාත්මක කළ යුතු ය.

12. භාරයෙහි අරමුණු නොපැවතීම නිසා හෝ භාරය ක්‍රියාත්මක කිරීමට නොහැකි වීම නිසා හෝ භාරයේ කටයුතු ව්‍යර්ථ වූ අවස්ථාවක, භාරයේ ඉතිරි මුදල් ලංකා ජාතික සර්වෝදය ශ්‍රමදාන (සංස්ථාපිත) සංගමයේ ප්‍රයෝජනය සඳහා යොදාගැනීම පිණිස භාරකරුවන් විසින් නිසි බලය ඇති අධිකරණයක් වෙත ඉල්ලීමක් කළ යුතු ය.

13. භාරකරුවන් භාරයේ දේපළ වංචා කිරීම සම්බන්ධයෙන් වරදකරුවන් වුව හොත් මිස, භාරයේ දේපළට සිදුවන යම් හානියක් සම්බන්ධයෙන් භාරය කිසි විටක වග නොකිව යුතු ය.

14. භාරයේ දේපළ කිසිවිටක ප්‍රාරම්භකට හෝ ඔහුගේ අනුප්‍රාප්තිකයන්ට හෝ පැවරුම්ලාභීන්ට නැතහොත් වෙනත් යම් තැනැත්තකුට ආපසු හිමි නොවිය යුතු ය.

15. 12 වන ඡේදයෙහි අනාකාරයෙන් විධිවිධාන සලස්වා ඇති පරිදි හැර, භාර අරමුදලෙහි යම් කොටසක් හෝ ඉන් ලැබෙන ආදායම් හෝ මෙයින් ඇති කරනු ලබන භාරයේ කාර්ය නොවන වෙනත් යම්කිසි කාර්යයක් සඳහා උපයෝගී කර ගනු නොලැබිය යුතු ය.

මීට සාක්ෂි වශයෙන්, මෙහි සඳහන් පාර්ශ්වකරුවන් විසින් වර්ෂ එක් දහස් නව සිය අසූ තුනක් වූ මාර්තු මස හතර වන දින වූ මෙදින මේ ලියවිල්ලට ද මේ ලිය විල්ලේම භාවය හා දිනය ඇති වෙනත් ලියවිලි හතරකට ද අනුරාධපුරයේ දී අත්සන් තබන ලදී.

අප ඉදිරියෙහි අත්සන් තබන ලදී. මෙහි අත්සන් තැබූ තැනැත්තන් අප හොඳා කාර දන්නා බවත් ඔවුන්ගේ නියම නම්, රැකියා සහ පදිංචි ස්ථාන දන්නා බවත් අපි ප්‍රකාශ කර සිටිමු.

1. අ/ක. කේ. දසනායක
2. අ/ක. කේ. පී. එල්. පෙරේරා

1. අ/ක. ඒ. ටී. ආරියරත්න
2. අ/ක. එම්. ඩබ්ලිව්. කරුණානන්ද
3. අ/ක. බී. ඒ. ඩී. ගුණසිංහ
4. අ/ක. එස්. වී. රාජසූරිය
5. අ/ක. ඩබ්ලිව්. කන්දගේ
6. අ/ක. එන්. රත්නපාල
7. අ/ක. පී. අමරසිංහ
8. අ/ක. ඩබ්ලිව්. එස්. පී. ද මැල්
9. අ/ක. එම්. ඊ. ඩබ්ලිව්. පීරිස්.

අ/ක. ඩී. පී. බී. මහදිවුල්වැව,
ප්‍රසිද්ධ නොතාරිස්.

මෙයට සාක්ෂිකරුවන් වශයෙන් ඉංග්‍රීසියෙන් නොපැහැදිලි ලෙස අත්සන් තැබූ මා දන්නා හඳුනන මොරටුවේ, රාවතාවත්ත පාරේ, අංක 98 දරන ස්ථානයෙහි පදිංචි කරුණාරත්න දසනායක සහ කොළඹ 6, කොලිංවුඩ් පෙදෙසේ අංක 51 දරන ස්ථානයෙහි පදිංචි කලහේ පතිරනගේ ලෙස්ලි පෙරේරා ඉදිරිපිට දී මා දන්නා හඳුනන 1. ආචාර්ය අහංගමගේ ටියුඩර් ආරියරත්න, 2. මල්ලිය වඩු කරුණානන්ද මහතා, 3. බෙරගම ආරච්චිගේ ධර්මා ගුණසිංහ මහතා, 4. සීතා වර්ජිනියා රාජසූරිය මහත්මිය, 5. විලියම් කන්දගේ මහතා, 6. මහාචාර්ය නන්ද සේන රත්නපාල, 7. ආචාර්ය පැලැනගේ අමරසිංහ, 8. සතිස් ද මැල් මහතා සහ 9. මල්වත්තගේ එඩ්මන්ඩ් වෝල්ටර් පීරිස් මහතා විසින් යථා පරිදි කියවා බලන ලදුව, එකී විලියම් කන්දගේ මහතා සහ මහාචාර්ය නන්දසේන රත්නපාල විසින් සිංහලයෙන් ද, අනෙක් සියලු දෙනාම විසින් නොපැහැදිලි ලෙස ඉංග්‍රීසියෙන් ද, එකී සාක්ෂිකරුවන් විසින් ද, එකී නොතාරිස් වන මා විසින් ද, මා ඉදිරිපිට දී සහ එකී තෙනා ඉදිරිපිට දී වර්ෂ එක් දහස් නවසිය අසූ තුනක් වූ මාර්තු මස හතර වන දින

අනුරාධපුරයේ දී සියලු දෙනාම පැමිණ සිටි එකම අවස්ථාවේ දී, එකී සාධන පත්‍රයට අත්සන් තබන ලද බව ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අනුරාධපුර යෙහි ප්‍රසිද්ධ නොතාරිස් දිවාකර පුංචිබණ්ඩා මහදිවුල්වැව වන මම මෙයින් සහතික කර සාක්ෂි දරා සිටිමි.

තවද මේ සාධන පත්‍රයේ අනුපිටපත රුපියල් දහයක වටිනාකම ඇති එක් මුද්දරයක් ද මුල් පිටපත රුපියල් එකක මුද්දරයක් ද දරන බව මම වැඩිදුරටත් සහතික කර සාක්ෂි දරා සිටිමි.

සහතික කරන ලද්දේ,

අ./ක. ඩි. පි. බී. මහදිවුල්වැව,
ප්‍රසිද්ධ නොතාරිස්.

සහතික කළ දිනය,
වර්ෂ 1983 ක්වූ මාර්තු මස 04 වන දින දී ය.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක් මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.